# ප්‍රචාරක දැන්වීම් පළ කිරීම සඳහා අවසර පත්‍ර නිකුත්කිරීමේ ක්‍රියාවලිය

සම්මත අතරු ව්‍යවස්ථා වැළඳගැනීම හෝ සභා අතුරු ව්‍යවස්ථා සම්මත කර ගැනීමට කටයුතු කිරීම

වාර්ෂික ගාස්තු පැනවීමේ යෝජනාව සභා සම්මත කිරීම

වාර්ෂික ගාස්තු පැනවීමේ යෝජනාව සහිත නිවේදනය ගැසට් පත්‍රයේ පළ කිරීම

නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය භාර දීම

අය කළ යුතු ගාස්තුව ගණනය කිරීම සහ නිර්දේශ කිරීම

ගාස්තුව අය කරගෙන සභාපතිවරයා වෙත යොමුකිරීම

අවසර පත්‍රය නිකුත් කිරීමට අනුමතය

අවසර පත්‍රය නිකුත් කිරීම

## 17.1 හැඳින්වීම

මහජනතාව වෙත කිසියම් සන්නිවේදනයක් නිකුත් කිරීම සඳහා පුවරුවක හෝ බැනරයක ආධාරයෙන් ප්‍රදර්ශනය කරනු ලබන සහ යම් ප්‍රසිද්ධ ස්ථානයක සිට බැලූ විට පෙනෙන පරිදි සවි කරනු ලබන දැන්වීම්වලින් දෘශ්‍ය පරිසරයට සිදු විය හැකි හානි වළක්වාලීම සඳහා ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම නියාමනය සඳහා මෙම සහතිකය නිකුත් කරනු ලබයි.

සටහන: පහත දැක්වෙන ආකාරයේ දැන්වීම් අවසර පත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවෙන් නිදහස් වේ.

ප්‍රදීප්ත ප්‍රචාරක දැන්වීමක් හෝ ගුවන් පුවරුවක් නොවන -

(අ) ශුද්ධ ලාභය පුණ්‍ය කටයුත්තක් සඳහා යොදවන යම් ප්‍රසංගයක දැන්වීමක්;

(ආ) කිසියම් ප්‍රසංගයක් පවත්වන ස්ථානයේ ඒ ප්‍රසංගයට අදාළ ප්‍රචාරක දැන්වීමක්;

(ඇ) ආගමික, දේශපාලනික හෝ මහජන රැස්වීමක් සම්බන්ධයෙන් වන ප්‍රචාරක දැන්වීමක්;

(ඈ) "කුලියට දීමට තිබේ" යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක්;

(ඉ) "විකිණීමට තිබේ" යනුවෙන් වූ ප්‍රචාරක දැන්වීමක්;

(ඊ) ගෘහ නාම පුවරු (එහි විශාලත්වය ප්‍රාදේශීය සභව විසින් තීරණය කරනු ලැබේ.)

(උ) වෘත්තීය කටයුතු සඳහා යොදාගනු ලබන ප්‍රමාණයෙන් වර්ගමීටර 0.093 ක් නොඉක්මවන නාම පුවරුවක් .

(ඌ) වෙළෙඳ කටයුත්තක් සඳහා යොදා ගන්නා වාහනයක ප්‍රදර්ශනය කරනු ලබන ඒ ව්‍යාපාරයේ ස්වභාවය, අයිතිකරුගේ නම, ලිපිනය හා දුරකථන අංක දැක්වෙන ප්‍රචාරක දැන්වීමක්.

## 17.2 නෛතික අධිකාරිය

පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ ප්‍රකාශිත ප්‍රචාරක දැන්වීම් / දෘශ්‍ය පරිසරය අතුරු ව්‍යවස්ථාව යටතේ මෙම අවසර පත්‍ර නිකුත් කරනු ලබයි.

## 17.3 ගාස්තු

ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කර ගැසට් පත්‍රයේ නිවේදනය කරනු ලබන ගාස්තුවක් ගෙවිය යුතුය.

## 17.4 ඉදිරිපත් කළයුතු ලේඛන

(අ) මෙහි උප ලේඛනයේ දැක්වෙන ආකෘතියට අනුව පිළියෙළ කර නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය.

(ආ) දැන්වීම් ප්‍රදර්ශණය කිරීමට අදහස් කරන නිර්මිතයේ පිහිටීමට සාපේක්ෂව 1:1000 ට නොඅඩු පරිමාණයකට අඳින ලද භූමි සැලැස්මක්.

(ඇ) 1:1000 පරිමාණයට නොඅඩු පරිමාවකට අඳින ලද එම නිර්මිතයේ රූප සටහනක්.

(ඈ) ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීමෙහි යොදා ගන්නා වර්ණ සියල්ලම යොදා කුඩා පරිමාණයකට අඳින ලද ඒ දැන්වීමේ පිටපතක්.

(ඉ) යාබද වීදිවලට සහ ප්‍රධාන භූමි සළකුණුවලට සාපේක්ෂව ප්‍රචාරක දැන්වීමෙහි පිහිටීම දැක්වෙන සැලැස්මක්.

(ඊ) ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අනුමැතිය දීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් තොරතුරු.

## 17.5 ඉල්ලුම් කිරීමේ කාර්යය පටිපාටිය

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|---|
| 1 | අවසර පත්‍රය ඉල්ලා ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රය භාර ගැනීම | ප්‍රචාරක දැන්වීම ස්ථාපිත කිරීමට පෙර | පෙරටු කාර්යාල නිලධාරි / විෂය භාර නිලධරයා |
| 2 | ඉල්ලුම් පත්‍රය අතුරු ව්‍යවස්ථාවල නියමවලට අනුකූල බවට තහවුරු කිරීම | ඉල්ලුම් පත්‍රය භාර ගත් දින හෝ ආසන්න දිනක | ලේකම් |
| 3 | අවසර පත්‍ර ගාස්තුව ගණන් බලා නිර්දේශ කිරීම | ඉල්ලුම් පත්‍රය භාර ගත් දිනහෝ ආසන්න දිනක | ආදායම් පරීක්ෂක |
| 4 | ගාස්තුව අය කර ගැනීමට අනුමැතිය දීම හෝ අවසර පත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමේ නියෝගය නිකුත් කිරීම | ඉල්ලුම් පත්‍රය භාර ගත් දිනහෝ ආසන්න දිනක | සභාපති / ලේකම් |
| 5 | ගාස්තුව අය කර ගෙන අවසර පත්‍රය සකස් කිරීම හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලිපිය සකස් කිරීම සහ අත්සනට ඉදිරිපත් කිරීම | ඉල්ලුම් පත්‍රය භාර ගත් දින සිට දින 03 ක් ගත වීමට පෙර | පෙරටු කාර්යාල නිලධාරි / විෂය භාර නිලධරයා |
| 6 | අවසර පත්‍රය / ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමේ ලිපිය අත්සන් කිරීම | ඉල්ලුම් පත්‍රය භාර ගත් දින සිට දින 03 ක් ගත වීමට පෙර | සභාපති / ලේකම් |
| 7 | අවසර පත්‍ර ලේඛනයට ඇතුල් කර අවසර පත්‍රය නිකුත් කිරීම | අනුමැතිය ලබාදුන් දිනය | විෂයභාර නිලධාරී |

සටහන: ප්‍රචාරක පුවරු ස්ථාන ගතකිරීමේ දී, පිහිටුවීමේ දී හා නඩත්තු කිරීමේ දී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතුය.

(අ) සියලුම ප්‍රචාරක දැන්වීම් පුවරුවල අවසර පත්‍ර අංකය සහ අවසර පත්‍රය නිකුත් කළ දිනය සටහන් කර තිබිය යුතුය.

(ආ) අවසර පත්‍ර හිමියාගේ නම සහ දුරකථන අංකය ප්‍රචාරක දැන්වීමේ පැහැදිලිව සඳහන් විය යුතුය.

(ඇ) ප්‍රචාරක දැන්වීම මගින් බාහිර පාර්ශවයකට සිදු විය හැකි අනතුරු ඇති වීම වළක්වාලීමට අවශ්‍ය වැඩ පිළිවෙළ යෙදිය යුතුය.

(ඈ) රියදුරන්ගේ අවධානයට බාධා නොවන පරිදි ප්‍රචාරක දැන්වීම් ස්ථාන ගත කළ යුතුය. උදා: මාර්ග හරහා බැනර් ප්‍රදර්ශනය නොකළ යුතුය.

(ඉ) ප්‍රාදේශීය සභාව විසින් අනුමත කළ ආකාරයෙන් ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කළ යුතුය.

## 17.6 නීති විරෝධීවව ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම පිළිබඳ නෛතික ප්‍රතිවිපාක

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|---|
| 1 | අවසර ලබා නොගත් දැන්වීම් පුවරු පිළිබඳව වාර්තා ලබා ගැනිම | සතියකට වරක් | ආදායම් පරීක්ෂක/බලය පැවරූ නිලධාරියා |
| 2 | දැන්වීම ප්‍රදර්ශනයට අනුමැතිය ලබා ගන්නා ලෙස දැනුම් දීම | හඳුනාගත් වහාම | විෂයභාර නිලධාරියා |
| 3 | දැනුම් දීමට අවනත නොවීම පිළිබඳව අධිකරණය වෙත වාර්තා කිරීම | දැන්වීම නිකුත්කළ දින සිට දින 07 කට පසු | විෂයභාර නිලධාරියා, ආදායම් පරික්ෂක, ලේකම් |
| 4 | අධිකරණ නියෝගය පරිදි කටයුතු කිරිම | | ආදායම් පරික්ෂක , ලේකම් |
| 5 | බලපත්‍රය ලබාගන්නා ලෙස නැවත දැනුම් දීම | අධිකරණ තීන්දුව නිකුත් කල දින සිට දින 07ක් ඇතුළත | විෂයභාර නිලධාරියා/ලේකම් |

සටහන : වෙළඳ බලපත්‍රයක් ලබා නොගැනීම මත අධිකරණයට වාර්තා කිරීමේදී භාවිතා කරන ආකෘති පත්‍ර සංශෝධන සහිතව භාවිතා කළ යුතුය.